වීරසිංහ, ඩබ්.එම්.
විලාසිනි රම්‍යලතා
PAPER

**ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාසල් වල මූල්‍යමය යෙදවුම් හා නිමවුම අතර බැඳියාව : ප්‍රමාණාත්මක විග්‍රහයක්**

**ඩබ්.එම්.වීරසිංහ, විලාසිනි රම්‍යලතා, මානව හා සමාජීය විද්‍යාපීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය**

රටක සාර්ථකත්වය රඳා පවතින්නේ මානව සම්පත වර්ධනය කර ගැනීම සඳහා එරට කොතරම් ශක්තිමත්ද යන සාධකය මතය. මානව සම්පත සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය අධ්‍යාපනය සමඟ සෘජුවම සම්බන්ධවේ. මේ නිසා සෑම රටකම රජය අධ්‍යාපනය වෙනුවෙන් විශාල මුදලක් වැය කරයි.රජය අධ්‍යාපනය වෙනුවෙන් කෙතරම් මුදල් වැයකලත් ඒවා කාර්යක්ෂමව උපයෝජනයවී නොමැති නම්, අධ්‍යාපනයේ අරමුණු ඉටු නොවේ.

ඒ අනුව මෙම අධ්‍යයනයේදී ඌව පළාතේ පළාත් සභා පාසල් අධ්‍යාපනයට පසුගිය දශකයේ වෙන්කල මූල්‍යමය යෙදවුම් හා ඉන් බිහිවූ නිමවුම අතර සබඳතාවයක් පවතීද යන්න විශ්ලේෂණය කර ඇත.දත්ත විශ්ලේෂණයේදී ප්‍රතීපායන විශ්ලේෂණය යොදාගෙන තිබේ. එහිදී පරායක්ත විචල්‍යය ලෙස සිසුන් විභාග සමත්වීමේ ප්‍රතිශතයත්, ස්වායක්ත විචල්‍යය ලෙස ගුරු වැටුප්, පරිපාලන වියදම්,ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ වියදම්, ගුරු පුහුණු වියදම්, සහ නිල ඇඳුම් හා ශිෂ්‍යාධාර යොදාගෙන තිබේ.නිමානය කරන ලද ප්‍රතිපායන ආකෘතීන්ට අනුව මූල්‍යමය යෙදවුම් හා විභාග සමත්වීමේ ප්‍රතිශතය අතර රේඛීය සම්බන්ධතාවයක් පවතින බව තහවුරු විය. ශිෂ්‍යත්ව විභාගය සමත්වීමේ ප්‍රතිශතය කෙරෙහි ගුරු වැටුප් හා පරිපාලන වියදම් මගින් ධන බලපෑමක් ඇති කරන අතර සෙසු සාධක මගින් ඇති කරන්නේ සෘණ බලපෑමකි. එසේම මූල්‍යමය යෙදවුම් අතරින් ශිෂ්‍යත්ව විභාගය සමත්වීමේ ප්‍රතිශතය තීරණය වීමට පරිපාලන වියදම් මගින් ඉහළ දායකත්වයක් සපයයි. අ.පො.ස.(සා/පෙළ) සමත් වීමේ ප්‍රතිශතය කෙරෙහි සියලුම මූල්‍ය යෙදවුම් මගින් ධන බලපෑමක් ඇති කරන අතර ඒ අතරින් ගුරු වැටුප් මගින් ඇති කරන බලපෑම සාපේක්ෂව ඉහළ වේ. අ.පො.ස.(උ/පෙළ) සමත්වීමේ ප්‍රතිශතය කෙරෙහි ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීමේ වියදම හැර සෙසු සාධක මගින් ධන බලපෑමක් ඇති කරයි. ඒ අතරින් ගුරු පුහුණු වියදම් වල බලපෑම සාපේක්ෂව ඉහළ වේ.

මේ අනුව අධ්‍යාපනය තුල මූල්‍යමය යෙදවුම් බෙදා හැරීමේදී ප්‍රාථමික අධ්‍යාපනය තුල පරිපාලන වියදම්ද, ද්විතීයික අධ්‍යාපනය තුල ගුරු වැටුප් ද, තෘතීයික අධ්‍යාපනය තුල ගුරු පුහුණු වියදම් ද, ඉහළ නැංවීම තුළින් සිසුන් විභාග සමත්වීමේ ප්‍රතිශතය ඉහළ නංවාගත හැකි බව තහවුරු විය. එක් එක් විභාග වර්ගය සමත්වීමේ ප්‍රතිශතය කෙරෙහි මූල්‍යමය යෙදවුම් ඇති කරන බලපෑම පිළිවෙලින් 91%,50%,63%, වේ. ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපනය තුල මූල්‍යමය යෙදවුම් වල කාර්ය භාරය සාපේක්ෂව ඉහළ වන අතර ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනයේදී මූල්‍යමය යෙදවුම් වලට අමතරව බලපාන වෙනත් මූල්‍යමය නොවන සාධකද පවතින බව නිගමනය කල හැක.